# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1656/38 - 2010 ජූනි 03 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

2009 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී (සංශෝධිත) ප්‍රඥප්තිය

**නිවේදනයයි**

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති, මිනිස් බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2009 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී (සංශෝධිත) ප්‍රඥප්තිය සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලද 2009.01.28 වැනි දින සිට එම බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2009 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී (සංශෝධිත) ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන බව මෙයින් ප්‍රකාශ කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති,
මිනිස් බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය.

වර්ෂ 2009 ක් වූ ජූලි මස 29 වැනි දින,
කොළඹ,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

***බස්නාහිර පළාත***

*2009 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී සංශෝධන ප්‍රඥප්තිය*

**බස්නාහිර පළාතේ 2007 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තිය**
**සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි**

මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2009 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී සංශෝධන ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන දිනයකදී ක්‍රියාත්මක වන්නේ ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :

1. 2007 අංක 01 දරන බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තියේ 10(3) උපවගන්තියට ඉක්බිතිව 10(4) වශයෙන් පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

10(4) මෙම අරමුදලට පළාත් පාලන ආයතන මඟින් ස්ථානීය දඩ, සේවා ගාස්තු ලෙස බැරවන මුදලින් 50 % ක ප්‍රතිශතයක් එකී පළාත් පාලන ආයතනයන්ට ඔවුන්ගේ පරිපාලන සීමාව තුළ නිශ්චිත කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා යොදාගතහැකි අතර, ඉතිරි මුදලින් 40 % ක ප්‍රතිශතයක් එම පළාත් පාලන ආයතනය අදාළ අපද්‍රව්‍ය කළමනාකරණ කලාපයේ ක්‍රියාත්මක වන හඳුනාගත් පොදු ව්‍යාපෘතියක් සඳහා යෙදවිය හැකි ය.

2. ප්‍රඥප්තියේ 2007 අංක 01 දරන බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තියේ 15(1) වගන්තිය පහත සඳහන් ලෙස සංශෝධනය කරනු ලැබේ :–

15 (1) අපද්‍රව්‍ය පොදු හෝ පෞද්ගලික පාරක් මත, ජලාශයකට, ඇළකට, දොළකට, ජල පහරකට, ඔයකට, ගඟකට, වැවකට, කළපුවකට හෝ මුහුදට යම් පොදු ස්ථානයක් මත දැමීම හෝ පෞද්ගලික ස්ථානයක් මත දැමීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වරදකරු කරනු ලැබූවිට 1 වැනි උපලේඛනයෙහි 2 වැනි තීරුවෙහි සඳහන් අපද්‍රව්‍ය ජනනය වන ප්‍රභවයෙහි ස්වාභාවය අනුව, ඊට අනුරූපීව එම උපලේඛනයෙහි 3 වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයන්ට නොඅඩු 4 වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයන්ට නොවැඩි දඩයකට හෝ මාස 3කට නොඅඩු වසර එකකට නොවැඩි සිරගත කිරීමක් හෝ එකී දෙයාකාරයකින් ම හෝ දඬුවමකට යටත්විය යුතු ය.

06-379

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.